www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව ආර්ථික ප්‍රශ්න යට ගසයි

## Sri Lankan Central Bank report covers up economic problems

**සමන් ගුනදාස විසිනි**
**2007 මැයි 16**

තම ආයතනයේ 2006 වාර්ෂික වාර්තාව පසුගිය මාසයේ දී නිකුත් කරමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති අජිත් නිවාඩ් කබ්රාල් රටෙහි ඉහල වර්ධන වේගය පිලිබඳව ජනාධිපති මහින්ද රාජපක්ෂට සුබ පැතී ය. සියයට 7.4ක වාර්ෂික වර්ධනය රාජපක්ෂගේ 2005 ජනාධිපතිවරන ප්‍රකාශනය වූ *මහින්ද චින්තනය* තුල පොරොන්දු වූ සියයට 8 මට්ටමට සමීප බව කබ්රාල් ප්‍රකාශ කලේ ය.

මේ වසරේ මහ බැංකු වාර්තාව ආර්ථිකය පිලිබඳ යථා තක්සේරුවකට වඩා දේශපාලන ප්‍රචාරක ලියවිල්ලක ස්වරූපය අත් කරගෙන ඇත. එය යලි යලිත් *මහින්ද චින්තනය* හුවා දක්වමින් එහි වැදගත්කම පැහැදිලි කිරීමට විශේෂ කොටසක් ද වෙන් කර ඇත. කබ්රාල් එම තනතුරට පත් කලේ රාජපක්ෂ විසිනි.

කෙසේ වුව ද ඉහල වර්ධන වේගය පිටුපස පවතින ආර්ථික හා සමාජ ගැටලු ගනනාවක් අවම වශයෙන් හෝ පිලිගැනීමට වාර්තාවට සිදුව ඇත. “මෙම යහපත් වර්ධනයන් පැවතිය ද නැගී එමින් පැවති උද්ධමනකාරී තර්ජනය ප්‍රතිපත්ති සම්පාදකයින්ට දැඩි අභියෝගයක් වියැ” යි කිසිම පැහැදිලි කිරීමකින් තොරව එය ප්‍රකාශ කලේ ය.

අප්‍රියෙල් 22 *සන්ඩේ ටයිම්ස්* පුවත් පත වඩාත් මධ්‍යස්ත තක්සේරුවක් ඉදිරිපත් කලේ ය. “වර්ධනය සමග ඉහල උද්ධමනය, උපරිම වෙලඳ හිගය, ගෙවුම් ශේෂයේ හිදැස් හා මුදලෙහි අවප්‍රමානය වීම අත්වැල් බැඳ ගැනීම හේතු කොට ගෙන බලලා මල්ලෙන් එලියට පැන ඇත.” ගුනාත්මක වශයෙන් සැලකූ විට වර්ධනය තීරනාත්මක නොවන්නේය යන සාමාන්‍ය මතය මෙම දර්ශකයන් මගින් විශ්වාසවන්ත ලෙස තහවුරු කර ඇත.

කොලඹ කොටස් වෙලඳ පලෙහි වත්මන් තත්වය ව්‍යාපාරික ක්ෂේත්‍රයේ අශුබවාදය ප්‍රතිබිම්බනය කරයි. පසුගිය වසරේ ඉහල අගයක් ගත් සමාගම්වල ලාබය නිසා කොටස් වෙලඳ පලෙහි මිල ගනන් සියයට 40කින් ඉහල ගිය අතර පෙබරවාරි 13 වනවිට අංක 3016 දක්වා උපරිම ලෙස නැගිනි. එතැන් සිට මැයි 13 වන විට අංක 2,665 දක්වා සියයට 13ක ශීඝ්‍ර බැස්මක් පැවතිනි.

වාර්තාව හෝ ආර්ථික නිවේදකයන් ඉහල වර්ධන වේගය හා ඊට සම්බන්ධිත ආර්ථික ව්‍යාධීන් සිටුපස පවතින හේතු ඉදිරිපත් නොකරයි. ප්‍රධාන සාධකයක් වන්නේ දෙමල ඊලාම් විමුක්ති කොටි සංවිධානයට (එල්ටීටීඊ) එරෙහි යුද්ධය රාජපක්ෂ විසින් යලි අරඹනු ලැබීමයි. ඔහුගේ 2005 නොවැම්බර් උද්ඝෝෂනයේ හා *මහින්ද චින්තන* මැතිවරන ප්‍රකාශනයේ හරි මැද ඇත්තේ ඊනියා ජාත්‍යන්තර සාම ක්‍රියා දාමය ප්‍රතික්ෂේප කිරීම හා එල්ටීටීඊයට එරෙහි තර්ජන ගනනාවකි. සුලු ඡන්ද සංඛ්‍යාවකින් ජය ගත් රාජපක්ෂ ප්‍රකෝපකාරී හා තර්ජනාත්මක නීච ආවෘත යුද්ධයකට මිලිටරිය මුදා හල අතර 2002 සටන් විරාම ගිවිසුම විවෘතව උල්ලංඝනය කරමින් 2006 ජූලියේ දී ප්‍රහාරයට නියෝග දුන්නේ ය.

ආර්ථික දත්තයන් සමීපව පිරික්සීමෙන් පෙනී යන්නේ යුද්ධයේ බලපෑම, ආර්ථිකයේ ඵලදායී අංශවල සැලකිය යුතු ප්‍රසාරනයක් නොමැතිවීම හා වැඩෙන සමාජ බෙදීම ය.

* දල දේශීය නිෂ්පාදිතයේ (දදේනි) සියයට 7.4ක වර්ධන වේගය 2005 පැවති සියයට 6ට වඩා නිශ්චිතවම ඉහල ය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රිලනිප) ලැබූ දැවැන්ත මැතිවරන පරාජය අභියස බලයට පත් වූ දක්ෂිනාංශික එක්සත් ජාතික පක්ෂය (එජාප) විවෘත වෙලඳපල ප්‍රතිසංස්කරන ක්‍රියාත්මක කිරීම ඇරඹූ 1978 වසරට පසුව පැවති වැඩිම වර්ධන වේගය මෙය වේ. මෙම ප්‍රතිව්‍යහුකරන හා පුද්ගලීකරන ක්‍රියා මාර්ග අනතුරුව බලයට පත්වූ ශ්‍රිලනිප හා එජාප ආන්ඩු විසින් ක්‍රියාත්මක කරන ලදුව දුප්පත් හා පොහොසත් භේදය තව තවත් ගැඹුරු කිරීමට තුඩු දුන්නේ ය.

පසුගිය වසරේ වර්ධනයේ අඩකටත් වඩා එනම් සියයට 4.1ක් සේවා අංශයට අදාල වන අතර වාර්තාව ප්‍රවේසම් සහගතව පවසන අයුරින් “එයට පාර්ශ්විකව හේතු වී ඇත්තේ සන්නද්ධ හමුදාවල ප්‍රසාරනයයි.” වෙන් වෙන් වශයෙන් විස්තර සැපයීමක් කර නොතිබුන ද මෙම අංශයේ වර්ධනයේ අනෙකුත් අංග නම් කොටස් වෙලඳ පලෙහි උද්ධමනකාරී හා පරපුටු ක්‍රියාන්විතයන් ද ඇතුලු මූල්‍ය සේවා, පුද්ගලික සෞඛ්‍ය හා අධ්‍යාපන සේවාවන් වේ. කර්මාන්ත අංශයේ වර්ධනය යන්තම් සියයට 2 වූ අතර කෘෂිකර්ම කෙෂත්‍රයේ සියයට 1.3ක් පමනි.

* රටෙහි සමස්ත නය බර සියයට 17න් ඉහල නැග්ග අතර 2006 අවසානයේ දී රුපියල් බිලියන 2,606.5ක් (ඇ. ඩොලර් බිලියන 23.6) විය. .2006 දී නය ගෙවුම් සේවා සියයට 28න් එනම් රුපියල් බිලියන 444.3ක්, දක්වා ඉහල ගියේ ය. මෙය සමස්ත ආන්ඩුවේ ආදායමෙන් සියයට 75ට ආසන්න ය. මහ බැංකුවට අනුව විදේශ නය 2006 තුල දී රුපියල් බිලියන 174.4කින් ඉහල ගිය අතර මීට ප්‍රධාන වශයෙන් හේතු වූයේ රුපියල දිගටම අව ප්‍රමානය වීම යි. පසුගිය වසර තුල ඩොලරයට සාපේක්ෂව රුපියල සියයට 9කින් පහත වැටුනු අතර මෙම වසරේ මුල් මාස හතර තුල තවත් සියයට 3.2කින් පහත වැටිනි.

* 2005 දී රටෙහි ගෙවුම් ශේෂය ඇ. ඩොලර් මිලියන 501ක අතිරික්තයක් පෙන්වීමට පාර්ශ්වික වශයෙන් හේතු වූයේ 2004 දෙසැම්බරයේ සුනාමියෙන් පසුව ලැබුනු විදේශ ආධාර ය. 2006 දී එම අතිරික්තය ඩොලර් මිලියන 204 දක්වා පහත වැටිනි. අතිරික්තයට ප්‍රධාන හේතුව වූයේ මැද පෙරදිග හා අනෙකුත් තැන්වල රැකියා කරන ශ්‍රී ලාංකිකයන් මිලියන 1.5ක් පමන මුදල් එවීම ය. පසුගිය වසරේ ඇ. ඩොලර් මිලියන 2,400ක් පමන වූ මෙම මුදල සෞඛ්‍ය සම්පන්න ආර්ථිකයක ලක්ෂනයක් නොව, උග්‍ර දරිද්‍රතාවයෙන් මිදීම සඳහා බොහෝ දෙනා සංක්‍රමනය වන බවට දර්ශකයකි.

සංක්‍රමනික කම්කරුවන්ගේ මුදල් එවීම් දිගටම ඉහල යාම නිසා විදේශ විනිමය උපයන්නා වූ තවත් මූලික ක්‍රමෝපායක් වූ සංචාරක ව්‍යාපාරය කෙරෙහි යුද්ධයේ ආර්ථික බලපෑම යටපත්ව ඇත. ජූලි මස ව්වෘත සටන් ඇරඹීමත් සමග ඉතාලිය ජර්මනිය ප්‍රංශය හා ඔස්ට්‍රේලියාව ඇතුලු රටවල් ගනනාවක් ශ්‍රී ලංකාවට ගමන් කිරීම අනතුරුදායක බවට උපදේශ නිකුත් කලහ. පසුගිය වසරේ අග කොටසේ දී සංචාරක පැමිනීම් පහත වැටුනු අතර මේ වසරේ දී එය තව තවත් පහත වැටින. මේ වසරේ පලමු මාස දෙකෙහි සියයට 15.6කින් පහත වැටුනු සංචාරක පැමිනීම් මාර්තුවේ දී සියයට 36කින් පහත වැටිනී.

සමස්තයක් වශයෙන් ගෙවුම් ශේෂයේ අතිරික්තයක් පැවතුන ද ශ්‍රී ලංකාවේ වෙලඳ හිගය 2005 දී පැවති ඇ. ඩො. මිලියන 2,516 සිට 2006 දී ඇ ඩො මිලියන 3,370 දක්වා සියයට 25කින් විශාල ලෙස ඉහල ගියේ ය. මීට එක් ප්‍රධාන හේතුවක් වූයේ 2005 දී ඇ ඩො මිලියන 1,655ක් වූ තෙල් ආනයනික වියදම 2006 දී ඇ ඩො මිලියන 2,070 දක්වා නොනැවතී ඉහල යාමයි. ඇගලුම් අපනයන වර්ධනය වීමේ වේගය චීනය ඉන්දියාව හා අනෙකුත් රටවලින් එල්ල වී ඇති වැඩෙන ජාත්‍යන්තර තරගකාරී බව තුල 2006 දී පහත වැටිනි.

තේ අපනයන ආදායම ඇ ඩො මිලියන 881 දක්වා ඉහල ගිය ද තේ නිපදවීම සියයට 2කින් පහත වැටිනි.

* වාර්තාව තුල සංඛ්‍යාවන් දක්වා නොතිබුන ද විදේශයන්ගෙන් මිලිටරි උපකරන දැවැන්ත ලෙස මිලට ගැනීම ද වෙලඳ හිගයට හේතු වී තිබේ. එක් දර්ශකයක් වන්නේ 2006 දී රු බිලියන 96ක් වූ ආරක්ෂක ඇස්තමේන්තු මුදල 2007 දී රු බිලියන 139,6 දක්වා සියයට 45කින් ඉහල දැමීමයි. ආරක්ෂක හමුදාවල නව උපායයන්ට සම්බන්ධිතව වියදම් අධික ගුවන් ප්‍රහාර මෙන්ම කාලතුවක්කු හා රොකට් ප්‍රහාරයන් ද වැඩි වශයෙන් යොදා ගැනේ.

එල්ටීටීඊය විසින් සැහැල්ලු අහස් යානා යොදා ගනිමින් මාර්තු හා අප්‍රේල් මාසවල ප්‍රහාර මාලාවක් එල්ල කිරීමෙන් අනතුරුව මිලිටරි වියදම් හරහා ආන්ඩුවේ වියදම් තව දුරටත් ඉහල යනු ඇතැයි ලංකා බිස්නස් ඔන්ලයින් (එල්බීඕ) මැයි 5 ලිපියක සඳහන් කලේ ය." ගුවන් හමුදාව නව උපකරන අත් කර ගැනීමට උත්සාහ දරන තතු යටතේ ශ්‍රී ලංකාවේ ආරක්ෂක වියදම් තව දුරට ඉහල යාම මගින් දැනටමත් ඉහල අගයක පවතින අය වැය හිගය පීඩනය ලක් වනු ඇතැ"යි වෙබ් අඩවිය කියා සිටයේ ය. හිටපු ගුවන් හමුදාපති හැරී ගුනතිලක කියා සිටියේ මෙම වසරේ ආරක්ෂක වියදම සියයට 50කින් ඉහල යා හැකි බව ය.

* "බැරෑරුම් ගෙවුම් ශේෂ අර්බුදයක් වලක්වා ගත හැකි වූයේ නිල වශයෙන් ඇ ඩොලර් විශාල ප්‍රමානයක් නයට ගැනීමෙන්" බව එල්බීඕ වාර්තා කලේ ය. මෙම වසරේ පලමු මාස 4 තුල පමනක් ආන්ඩුව ජාත්‍යන්තර මූල්‍ය වෙලඳ පලින් ඇ. ඩො. මිලියන 300ක් නය ගෙන ඇත. නය ගත නොහැකි විට ආන්ඩුව මුද්‍රන කාර්යයට හැරී ගනියි. පසුගිය ටසරේ අය වැය හිගය වූ සියයට 8.4 පියවීම සඳහා මහ බැංකුව රු බිලියන 38.5ක් මුද්‍රනය කර ඇත. මේ වසරේ හිගය සියයට 9.2 වෙතැයි ගනන් බැලේ.

* සුබසාධන මහජන සෞඛ්‍ය ආදී අත්‍යවශ්‍ය සේවාවන් කැපීම හා තියුනු බඩු මිල ඉහල යාම් හරහා යුද්ධයේ බර සෘජුවම කම්කරු ජනතාව මත පටවා ඇත. වර්ෂයේ සාමාන්‍ය උද්ධමන රේට්ටුව වූ සියයට 13.7ට සන්සන්දනාත්මකව 2006 දෙසැම්බරයේ වාර්ෂික උද්ධමන රේට්ටුට සියයට 19.3 කි. 2005 දෙසැම්බරයේ දී 4,055.5 වූ ජීවන වියදම් දර්ශකය 2006 දෙසැම්බරයේ දී 4610.8 දක්වා අංක 555කින් ඉහල ගියේ ය. මෙම වසරේ මාස හතර තුල අංක 414කින් එය ඉහල නැගිනි.

මහ බැංකු සංඛ්‍යා ලේඛනවලට අනුව 2006 දී පුද්ගලික අංශයේ මූර්ත වැටුප පහත වැටිනි. සේවා, වානිජ හා කර්මාන්ත කෘෂිකර්ම ක්ෂෙත්‍රයන්ගේ පහත වැටීම් ප්‍රතිශතයන් පිලිවෙලින් 11.8 10.8 හා 9.5 කි. රාජ්‍ය අංශයේ වැඩුනු නොසන්සුන්තාව හා විරෝධය යටපත් කිරීම සඳහා ආන්ඩුවට ලබා දීමට සිදු වූ වැටුප් වැඩි කිරීම් නිසා එම අංශයේ මූර්ත වැටුප් මට්ටම පහත නොවැටිනි. එනමුත් මේ වර්ෂය තුල ඉහල යන

උද්ධමනය නිසා රාජ්‍ය අංශයේ වැටුප් ද බාදනය වෙමින් පවතී.

මුදල් හා ආරක්ෂක ඇමති ද වන ජනාධිපති රාජපක්ෂ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (ජාමූඅ) හා ලෝක බැංකුවේ උපදෙස් මත රටෙහි සොච්චම් සුබසාධන ක්‍රියා මාර්ග සමගම මූලික සහනාධාරයන් ද කපා දැමී ය. ඉන්ධන සහනාධාරය කැපීම නිසා සාමාන්‍ය මහජනතාවට තදින් පහර වදින අයුරින් ඉන්ධන හා ගමනාගමන මිල තියුනු ලෙස ඉහල ගියේ ය.

ආන්ඩුවේ සමෘද්ධි සුබසාධන වැඩ පිලිවෙලෙන් සහනාධාර ලබන පවුල් ප්‍රමානය 2005 පැවති 1,960,664 සිට 2006 දී 1,913,568 දක්වා සියයට 2.5කින් පහත වැටින. මහ බැංකු වාර්තාව පැහැදිලි කිරීමක් නොකල ද "දුප්පතුන්ට පමනක් යොමු වීම" යන නමින් ආන්ඩුව ජාමූඅ හා ලෝක බැංකු පිලිවෙත් ඉදිරියට ගෙන ගියේ ය. සමෘද්ධි දීමනාව මසකට රුපියල් 250 සිට 1000 (ඇ ඩොලර් 10ක්) දක්වා වූ සුලු මුදලකි.

2005ට වඩා සියයට 2.9කින් 2006 වී අස්වැන්න වාර්තාගත ලෙස ඉහල ගිය බව මහ බැංකු වාර්තාව පවසයි. කෙසේ වුව ද ආන්ඩුව විසින් ඇති තරම් පහසුකම් නොසපයන ලද තතු තුල බොහෝ ගොවීන්ට තම අස්වැන්න රජය සහතික කල මිල වන රු 13.50ට විකුනා ගත නොහැකි විය. එහි ප්‍රතිපලයක් ලෙස ගොවීන්ට එක්කෝ තම අස්වැන්න අඩු මිලට දූෂ්‍ය වෙලඳුන්ට විකිනීමට සිදු විය. නැතහොත් කිසිසේත් විකුනා ගත නොහැකි විය.

තම ආර්ථික පෙරමුනෙහි ප්‍රතිපල පිලිබඳ රාජපක්ෂ අගය කිරීමට මහ බැංකු අධිපති උනන්දු වූවා විය හැකි නමුත් දැවැන්ත බහුතරයකට එහි බලපෑම විනාශකාරී ය. තව දුරටත් රට යලිත් යුද්ධයට ඇද දැමීම මගින් 2002 සටන් විරාම ගිවිසුම අත්සන් කිරීමට ප්‍රධාන හේතුවක් වූයේ විනාශකාරී මිලිටරි පරාජයන් මගින් ඇති කෙරුනු තියුනු ආර්ථික අර්බුදය බව ආන්ඩුවට සම්පූර්නයෙන් ම අමතක වී ඇති සෙයකි. මහ ඉහලින් අගය කෙරුනු 2006 වර්ධන වේගය 2001 දී මෙන් වේගයෙන් වාෂ්ප වී ආර්ථිකයේ කිසිම වර්ධනයකින් තොරව තියුනුව සංකෝචනය වීමකට බඳුන් විය හැකි ය.

© www.wsws.org